**මහව ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2021 වර්ෂයේ සිදුකරන ලද ගුරුගොඩ රජමහා විහාරයට යන මාර්ගය කළුගල් ඇල්ලීමේ ව්‍යාපෘතියට ගෙවිය යුතු සියයට 10 රඳවුම් වටිනාකම වූ රු.76,900ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 (i) වගන්තිය | හිඟ හිටි ශේෂ තුළ වූ වර්ෂ 1කට වැඩි රු.4,550,898ක හිඟ වරිපනම් ශේෂයක් හා රු.7,407 ක හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල අයකර ගැනීමට රතු නිවේදන නිකුත් කර ඇති බව. | අදාළ වගන්තියේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) 218 රීතිය | වාර්ෂිකව ඉඩම් ගොඩනැගිලි ඇතුළු ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | සමීක්ෂණයක් විධිමත් ලෙසින් ඉදිරියේදී සිදු කරන බව. | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 මුදල් රෙගුලාසිය | වටිනාකම රු.2,589,413 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 175ක් නියාදනය කර නොතිබුණි. | තැන්පත් නිදහස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,387,653ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,281,032ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 වර්ෂය | | | | 2021 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල් කළ ආදායමින්) | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමින්) |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 5,432 | 5,520 | 4,138 | 1,382 | 5,432 | 5,062 | 3,500 | 1,562 |
| කුලී | 20,201 | 12,134 | 8,456 | 3,678 | 19,712 | 8,186 | 8,186 | - |
| බලපත්‍ර ගාස්තු | 830 | 545 | 545 | - | 918 | 568 | 568 | - |
| වෙනත් ආදායම් | 8,370 | 15,565 | 724 | 14,841 | 16,011 | 9712 | 1483 | 8,229 |
| එකතුව | 34,833 | 33,764 | 13,863 | 19,901 | 42,073 | 23,528 | 13,737 | 9,791 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 106.8 ද , බිල් කළ ආදායම රු.මිලියන 33.7ක් ද රැස් කළ ආදායම රු.මිලියන 13.8 ක් ද වී තිබූ අතර බිල්කළ ආදායමින් රු.මිලියන 19.9 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගත යුතු ව පැවතුණි. | හිඟ බදු අයකර ගැනීමට දැනුවත් කිරීම්,සමථ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් හා අධිකරණ ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **වරිපනම් හා බදු** | | |
| | වර්ෂයට අදාළ වරිපනම් හා බදු ආදායමින් රු.මිලියන 1.4 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | හිඟ වරිපනම් හා බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ වලට අදාළව හිඟ බදු කුලී රු.2,601,734 ක් හා හිඟ කඩ කුලී රු.1,925,840ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් අයවිය යුතුව පැවතුණි. | සමාලෝචිත වර්ෂය තුළ පවතින හිඟ බදු කුලී පවතින වර්ෂයේ අයකර ගැනීමට කටයුතු කරන අතර සමහර හිඟ බදු කුලී සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | හිඟ බදු කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.13,095,130ක් හා මුද්දර ගාස්තු රු.17,012,974ක් විය. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අතුරු ව්‍යවස්ථා** | | |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා කිසිවක් සම්බන්ධයෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ පනවා නොමැති අතර සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම පමණක් සිදු කර ඇති බව. | සභාවට ආදායම් උපයා ගැනීමට හැකි අවස්ථා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු වර්ෂ 5කට වරක් තක්සේරු කළ යුතු වුවත් 2012 වර්ෂයෙන් පසු සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු තක්සේරු කිරීමක් සිදු කර නොතිබුණි. | නැවත දේපල තක්සේරුවක් කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් වරිපනම් බදු තක්සේරුව සිදුකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 13ක රු.64,325,638 ක් ලැබිය යුතු ශේෂයක් පැවති අතර ඉන් රු.844,521ක් අයිතම 7කට අදාළව වසර 5කට වැඩි ශේෂයක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 අයිතම 15කට අදාළව රු.27,820,588 ක ගෙවිය යුතු ශේෂයක් පැවති අතර ඉන් රු.844,521ක් අයිතම 7කට අදාළව වසර 5කට වැඩි ශේෂයක් විය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාවට පවරා තිබූ සුසානභූමි 04ක වටිනාකම සහ ඉඩමක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ තක්සේරු කර ඉදිරි ගිණුම් වලට ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනැති භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඉන්වෙන්ට්‍රිගත නොකළ භාණ්ඩවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් තුළින් ගලපන බව. | -එම- |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සේවකයින් 8 දෙනෙකුට අදාළව එකතුව රු.222,644ක අය නොවන සේවක ණය ශේෂයක් පැවතුණි. | මෙම සේවකයින්ගේ ණය කපා හැරීම පිළිබඳව උපදෙස් පතා පළාත්පාලන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.186,277,627ක් වූ ඉඩම් 10ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | අදාළ ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට සභාව සතු පවරා නොගත් වටිනාකම නිශ්චිතව හඳුනාගත නොහැකි ඉඩම් හා පොදු ළිං 38ක් විය. | හඳුනා ගැනීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව සතු දේපල නිශ්චිතව හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |
| (ඇ) | වටිනාකම රු.2,400,000ක් වූ සභාව විසින් භාවිතයට ගන්නා වාහන 02ක් හා ඉඩම් 04ක් නිරවුල්ව හඳුනාගෙන සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන දෙක සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව. | වත්කම් පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කළ යුතුය. |
| (ඈ) | ලී බඩු හා සවි කිරීම්,යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ පරිගණක උපාංග වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගත යුතුය. |

## 3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පවතින රු.525,000ක වටිනාකමින් යුතු ට්‍රැක්ටර් රථ 02ක් පිළිසරු මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි නිෂ්ක්‍රීයව පැවතුණි. | වාහන අපහරණය කිරීමට පළාත්පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් පතා ලිපි යොමු කර ඇති බව. | වත්කම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කල යුතුය. |
| (ආ) | සභාව සතුව නළ ළිං 216ක් පැවති අතර ඉන් 159ක් පමණ අක්‍රිය මට්ටමේ පැවතුණි. | ජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් අනුව නඩත්තු කටයුතු සිදු කරන බව. | නඩත්තු කටයුතු සිදුකර ප්‍රයෝජනයට ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආදායම් ශීර්ෂ 03ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 40 සිට 64 දක්වා විචලනයක් පැවතුණ අතර වියදම් ශීර්ෂ 42ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 40කට වඩා වැඩි විචලනයක් පැවතුණි. තවද වියදම් විෂයන් 40ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය කිසිදු වියදමක් නොදරා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි | 2023 වර්ෂයට අදාළව අයවැය ලේඛනය ඵලදායීව යොදා ගැනීමට කටයුතු කරන බව. | තාත්විකව අයවැය ලේඛනය සකස් කළ යුතුය. |